# යක්ෂයෝ ස්වදේශිකයෝ ද?

පඬුඅබාගේ ගෝත්‍රය යක්ෂ නොවන බවත් ඒ යක්ෂ යැයි කියා ඇත්තේ කුමාරතුංග මුනිදාස මහතා පමණක් බවත් ඔහු ද ප්‍රබන්ධ සංග්‍රහයෙහි කියා ඇත්තේ ඒ පිළිබඳ නිශ්චිත ප්‍රකාශයක් නොවන බවත් අපි දනිමු. හුදු සැකයක් මත කුමාරතුංග මුනිදාස මහතා ගොඩනැගූ තර්කයකින් කිසිවක් කිව නොහැකි බව පඬුඅබාගේ පීතෘත්වය ගැන අද ඊනියා කුමාරතුංග මතයක් ගැන කියන්නවුන් වටහාගත යුතු ය. පඬුඅබාට යක්ෂ ගෝත්‍රික උත්පත්තියක් ලබාදීමට උත්සාහ ගන්නවුන් අතර කැපී පෙනෙන පොදු ලක්ෂණය නම් මහාවිහාරයට ඇති ඔවුන්ගේ විරුද්ධත්වය ය.

මේ මහාවිහාරයට විරුද්ධ වන්නන්ගේ යටි අරමුණ ගැන අටුවා ටීකා අවශ්‍ය නො වෙයි. මොවුන් පැවසීමට තැත් කරන්නේ යක්ෂ ගෝත්‍රිකයන් ස්වදේශිකයන් බවත් දඹදිවින් පැමිණි ආර්යයන් මේ ස්වදේශික යක්ෂ ගෝත්‍රිකයන් පරදවා රාජධානි පිහිටුවා ගත් බවත් එහි දී යක්ෂ ගෝත්‍රික කුමාරිකාවක වූ කුවේණියගේ සහාය විජය කුමරුට ලැබුණු බවත් ය. මොවුන්ට අනුව ස්වදේශික යක්ෂ ගෝත්‍රිකයන් දිගින් දිගට ම විජාතික ආර්යයන්ට විරුද්ධ වී ඇති නමුත් ආර්යයන්ගේ බලය නැතිකිරීමට ඔවුන්ට නොහැකි වී ඇත.

මොවුන්ගේ මතයට අනුව අවසානයේ දී ආර්යයන් පරාජය කරනු ලැබ ඇත්තේ ස්වදේශික යක්ෂ ජන්ම ලාභයක් ලත් පඬුඅබා කුමරු විසිනි. මේ විජාතිකයන්ට, අවශ්‍ය නම් විජාතික ආක්‍රමණිකයන්ට, එරෙහිව ස්වදේශික යක්ෂ ගෝත්‍රිකයන් විසින් කරන ලදැයි කියන සටන් ආකර්ශනීය වන නමුත් දේශප්‍රේමයට ආවඩන නමුත් එහි සංගත බවක් නොමැති බව අපි දුටුවෙමු. මොවුන් ව්‍යාජ ආකාරයකින් ඉස්මතු කිරීමට තැත් කරන්නේ පඬුඅබා කුමරුගේ ඊනියා යක්ෂ උත්පත්තිය පිළිබඳ කතාව ය. එහෙත් එවැනි කතාවක් සංගත ආකාරයකින් ගොඩනැගිය නොහැකි බව මේ වන විට මොවුන්ට අවබෝධ වී තිබිය යුතු ය.

පඬුඅබා කුමරුට යක්ෂ උත්පත්තියක් දීම කෙසේ වෙතත් යක්ෂයන් ආරම්භයේ දී ස්වදේශිකයන් ද යන ප්‍රශ්නය නැගිය හැකි ය. ඉන් අදහස් කරන්නේ යක්ෂ ගෝත්‍රිකයන් ඉතිහාසයේ කෙදිනක හෝ විදේශයකින් මෙරටට පැමිණියේ ද යන්න ය. සිංහල ජාතිය නිර්මාණය වී ඇත්තේ සිංහ වාංශිකයන්ගේ දේශපාලන නායකත්වයෙන් විවිධ ගෝත්‍ර හා ජනවර්ග එකතුවීමෙනි. ඒ ජාතිය ගොඩනැගීමෙහි නායකත්වය ගෙන ඇත්තේ පඬුඅබා කුමරු ය. ඔහු සංස්කෘතික වශයෙන් යක්ෂ විය.

මෙහි දී අපේ ප්‍රශ්නය වනුයේ ඒ ඒ ගෝත්‍රවල වංශවල සම්භවය කුමක් ද යන්න ය. විජයගෙන් සංකේතවත් වන අර්ධ වෛදිකයන් දඹදිවින් වසර ගණනාවක් තිස්සේ සංක්‍රමණය වී ඇති බැවින් ඔවුන්ට ආරම්භයේ දී විජාතිකයන් යැයි කීමේ වරදක් නැත. එහෙත් මේ විජාතිකයෝ සැමදාමත් විජාතිකයන් ලෙස නො සිටියහ. ඔවුන් මෙරටට පැමිණි පසු ආපසු දඹදිවට ගිය බවක් සඳහන් නො වෙයි. මේ ඉතා වැදගත් කරුණකි.

දඹදිවින් පැමිණි අර්ධ වෛදිකයන් (ආර්යයන්) මෙන් නොව ඉන් බොහෝ කලකට පසුව ආක්‍රමණිකයන් ලෙස පැමිණි ද්‍රවිඩයෝ බොහෝ විට, විශේෂයෙන් යුද්ධවලින් පැරදීමෙන් පසුව ආපසු ගිය හ. ඉන්පසු ලන්දේසීන් විසින් දුම්කොළ වගාවට ගෙන්වනු ලැබූ දෙමළ ජනයා අස්වැන්න නෙළා ගැනීමෙන් පසු ආපසු දකුණු ඉන්දියාවට ගියහ. ලංකාවේ ස්ථිර දෙමළ වාසස්ථාන ඇරඹීමට බොහෝ කල් ගතවී ඇති බව පැහැදිලි ය.

මෙරටට පැමිණි අර්ධ වෛදිකයන් දේශපාලන ආධිපත්‍යයක් පැතිර වූ ආකාරයෙන් ද්‍රවිඩ ජනයා මෙරට දේශපාලන ආධිපත්‍යයක් පතුරවා නැත. වැඩිම වුවහොත් ඔවුන් කර ඇත්තේ චෝල අධිරාජ්‍යයේ කොටසක් බවට රටෙන් යම් ප්‍රදේශයක් පත්කර ගැනීම ය. ඒ යුරෝපීය යටත්විජිතවාදීන් කළ දෙයින් එතරම් වෙනස් නො වී ය. යුරෝපීයයෝ ද අප රටවල් තම යටත්විජිතවල කොටස් බවට පත්කර ගත්තා මිස මෙරට රාජ්‍ය හෝ රාජ්‍යයක් ගොඩනැගීමට උත්සාහ නො කළහ.

© Prof. Nalin De Silva

එලෙස සැලකූ විට අර්ධ වෛදිකයෝ මෙරට කාලිංගයේ හෝ වංගයේ හෝ දඹදිව වෙනත් ප්‍රදේශයක හෝ යටත්විජිතයක් බවට පත්කිරීමට උත්සාහ නො කළහ. ඔවුහු මෙරට දඹදිවින් හෝ භාරතයෙන් හෝ ස්වාධීන වූ වෙන ම රාජ්‍යයක් ගොඩනැගීමට උත්සාහ කළහ. ඒ අරුතින් ගත්කල ඉතා සුළු කලකට හැර අර්ධ වෛදිකයන් විජාතිකයන් ලෙස සැලකිය හැකි නො වේ. අර්ධ වෛදිකයෝ නොබෝ කලකින් ම මෙරට ස්ථිර පදිංචිකරුවෝ වූහ. විජයගෙන් සංකේතවත් වන්නන්නට ආපසු දඹදිවට යැමේ අවශ්‍යතාවක් නො වී ය. එබැවින් යක්ෂ ගෝත්‍රිකයන් ස්වදේශිකයන් ය අර්ධ වෛදිකයන් ය විජාතිකයන් ය යන්න තේරුමක් නැති කතාවක් පමණකි.

අනෙක් අතට යක්ෂ ගෝත්‍රිකයන්ගේ සම්භවය පිලිබඳ ව කිවහැක්කේ කුමක් ද? ඔවුහු මෙරට හෝ දඹදිව හෝ අනාදිමත් කාලයක් තිස්සේ පදිංචි ව සිටි පිරිසක් නො වූහ. ඔවුන් දඹදිවට හා ලංකාවට පැමිණ ඇත්තේ ආර්යයන් දඹදිවට පැමිණීමට සියවස් කිහිපයකට පෙර පර්සියාවේ සිට ය. ඇතැම් විට ඒ පර්සියාවේ බටහිර සිට විය හැකි ය. ඔවුන්ට දියුණු තාක්ෂණයක් තිබූ බවට සාක්ෂි ඇත. අප වැව් තැනීම ඇරඹුයේ ඔවුන්ගේ තාක්ෂණය උපයෝගී කරගෙන බවට මතයක් වෙයි.

බොහෝ විට යක්ෂ ගෝත්‍රිකයන් මුළු දඹදිව පුරා ම ව්‍යාප්ත ව සිටියේ යැයි කිව හැකි ය. එහෙත් ආර්යයන්ටත් බොහෝ කලකට පසුව බටහිර ආසියාවෙන් හෝ අප්‍රිකාවේ උතුරු ප්‍රදේශයෙන් හෝ දඹදිවට පැමිණි ද්‍රවිඩයන් භාරතයේ දකුණේ යක්ෂ ගෝත්‍රිකයන් පරාජය කර ඔවුන් තම සංස්කෘතියට අවශෝෂණය කරගන්නට ඇත. එහෙත් ලංකාවේ හා දඹදිව උතුරේ යම් කාලයක් යක්ෂ ගෝත්‍රිකයන් තම අනන්‍යතාව රැකගනිමින් ජීවත් වූ බව පෙනෙයි.

යක්ෂ ගෝත්‍රිකයන් ද ලංකාවට පැමිණියේ පිටින් වුව ද ඔවුන්ට ද රට අත්හැර යැමේ වුවමනාවක් තිබී නැත. ඔවුන් ලංකාවේ තැන තැන තම රාජධානි ගොඩනගාගෙන ජීවත් වී ඇති බව පෙනී යයි. මේ රාජ්‍යය බොහෝ විට මහවැලි ගඟ අසබඩ හා රජරට ඇතැම් ප්‍රදේශවල ද සබරගමුවේ ද තිබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. යක්ෂ ගෝත්‍රිකයන්ට ස්වදේශිකයන් යැයි කිව හැක්කේ ඒ අර්ථයෙනි. සම්භවය ලෙස ගත්කල ඔවුහු ද අර්ධ වෛදිකයන් මෙන් ම පිටින් පැමිණි අය වූහ. අර්ධ වෛදිකයන් විජාතිකයන් නම් යක්ෂ ගෝත්‍රිකයන් ද විජාතිකයන් විය යුතු ය.

අපි ඒ දෙකොටසින් එක් කොටසක් වත් විජාතිකයන් ලෙස නො සලකමු. අපට ඔවුන් දෙගොල්ලෝ ම මුළ දී පිටින් පැමිණි එහෙත් ස්වල්ප කලකින් ම මෙරට ස්ථිර වාසස්ථාන ගොඩනගා ගත් ස්වදේශිකයෝ වූහ. ඔවුහු පැහැදිලිව ම පසුව පැමිණි ද්‍රවිඩයන්ගෙන් හා යුරෝපීයයන්ගෙන් වෙනස් වූහ. එසේ වුවත් යක්ෂ හා අර්ධ වෛදිකයන් අතර වෙනසක් නොතිබුණා නො වේ. ඔවුහු චින්තනයෙන් වෙනස් වූහ.

අර්ධ වෛදිකයෝ පූර්ණ වෛදිකකරණයකට ලක් නො වූහ. ඔවුහු මූලික වශයෙන් දඹදිව ආර්යයන් පැමිණීමට පෙළ තිබූ චින්තනයට අයත් වූහ. ඔවුන් වෛදිකකරණයට ලක්ව සිටියේ මඳ වශයෙනි. එහෙත් යක්ෂ ගෝත්‍රිකයෝ බොහෝ දුරට තමන් පර්සියාවෙන් හෝ එයට වටහිරින් පිහිටි ප්‍රදේශයකින් රැගෙන ආ චින්තනය විශාල වශයෙන් රැකගෙන ඇති බව පෙනෙයි. මේ චින්තනය ඔවුන් පැමිණීමට පෙර දඹදිව හා ලංකාවේ තිබූ චින්තනයෙන් යම් ප්‍රමාණයකට වෙනස් වූ බව පෙනී යන කරුණකි.

වෙනත් වචනවලින් කිවහොත් යක්ෂ ගෝත්‍රිකයෝ අර්ධ වෛදිකයන්ට පෙර ලංකාවට පැමිණ ස්ථිර වාසස්ථාන පිහිටුවා ගත්හ. එහෙත් ඔවුන්ගේ චින්තනය එකල ලංකාවේ විසූ ජනයාගේ චින්තනයෙන් වෙනස් විය. අනෙක් අතට අර්ධ වෛදිකයන් යක්ෂ ගෝත්‍රිකයන්ට පසුව ලංකාවට පැමිණ ඇති නමුත් අර්ධ වෛදිකයන් පූර්ණ වෛදිකකරණයට ලක් නොවූ බැවින් ඔවුන්ගේ චින්තනය මෙරට වැසියන්ගේ චින්තනයෙන් එතරම් වෙනස් නො වී ය.

මේ වෙනස ඉතා වැදගත් ය, අර්ධ වෛදිකයන් පැමිණීමෙන් පසු මෙරට ප්‍රධාන වශයෙන් සටන් ඇති වී තිබෙන්නේ ඔවුන් හා යක්ෂ ගෝත්‍රිකයන් අතර ය. ඒ සටන් පොළොන්නරු කාලය දකාවා ම දිවයන බව පැහැදිලි ය. අනෙක් අතට යක්ෂ ගෝත්‍රිකයන් මේ කලාපයේ බිහි වූ ආගමක් වන බුද්ධදහම වැළඳ ගැනීමේ දී එතරම් උනන්දුවක් දක්වා නැති බව පැහැදිලි ය.

© Prof. Nalin De Silva

මේ කරුණුවලින් පැහැදිලි වන්නේ අර්ධ වෛදිකයන් යක්ෂ ගෝත්‍රිකයන්ට පසුව මෙරටට පැමින ඇති නමුත් චින්තනය වශයෙන් ගත්කල අර්ධ වෛදිකයන් මෙරට විසූ අනෙක් ගෝත්‍ර සමග සහජීවනයකින් පසු වූ බව ය. ඒ අර්ථයෙන් යක්ෂ ගෝතිකයන්ට වඩා අර්ධ වෛදිකයෝ මෙරටට සමීප වූහ.

එබැවින් යක්ෂ ගෝතිකයන් ස්වදේශිකයන් ය අර්ධ වෛදිකයන් විජාතිකයන් ය යන්න කිසිසේත් ම තේරුමක් නැති කතාවක් බවට පත්වෙයි. මහාවිහාරික භික්ෂූන් වහන්සේ විවේචනය කරමින් උන්වහන්සේ විජාතිකයන්ට කත් ඇදී බව පවසමින් යක්ෂ ගෝතිකයන්ගෙ ස්වදේශිකත්වයක් ගැන පුන පුනා කතාකරන්නේ යක්ෂ ගෝත්‍රිකයන්ට ඇති ඇල්මකින් නොව මහාවිහාරික භික්ෂූන් වහන්සේට ඇති විරුද්ධතාව නිසා බව පැහැදිලි ය.

අපට මෙහි දී අවශ්‍යවන්නේ පඬුඅබා රජු මේ සියළු ගෝත්‍ර හා වංශ එකතුකළ ආකාරය ගැන හැදෑරීම ය. එයට ප්‍රධාන හේතුව එය අදට වෙන කවදාටත් වඩා අදාළ වීම ය. අද ද අපි පඬුඅබා මළුහුණ දුන් ප්‍රශ්නය වැන්නකට මුහුන දී සිටිමු. අපට අද ප්‍රශ්නයට ද විසඳුම් සෙවිය හැක්කේ පඬුඅබා රජු ඔස්සේ මිස යුරෝපීය හෝ වෙනත් ආකෘති ඔස්සේ නො වෙයි. එබැවින් පඬුඅබා රජු කල සිදුවූයේ කුමක් ද යන්න ඉතා කල්පනාකාරීව හැදෑරිය යුතු ය. එහි දී කිසිදු ආකාරයක විකෘතිකිරීම් වලට ඉඩ නොදිය යුතු ය. මහාවිහාරික භික්ෂූන් වහන්සේ විවේචනය කරමින් පඬුඅබාගෙ පීතෘත්වය විකෘති කරමින් ඇතැමුන් සැරසෙන්නේ සිංහල බෞද්ධ වේශයෙන් පෙනී සිටිමින් සිංහල බෞද්ධකමට පහර ගැසීමට ය. අපි ඒ අරමුණු හෙළිදරව් කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva